**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/95**

මගේ අංකය : 1/543 ඒ/02/ඩී/02/94(1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995 පෙබරවාරි 06 දින

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>1994-09-09 දින දරණ</u>**
**<u>වැටුප් විෂමතා හා සංශෝධන කමිටු වාර්තාව</u>**

මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ (ම.ම.කා.සේ.) වැටුප් ප්‍රතිශෝධනය නිසා පැනනැගී ඇති කරුණු ගැන සොයා බලා හදිසි වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස පත්කරන ලද වැටුප් සංශෝධන හා විෂමතා කමිටුවේ වාර්තාවේ නිර්දේශ රජය විසින් පිළිගෙන ඇත.

02. සේවාවන්ගේ සහ ඒ ඒ සේවාවනට අනුයුක්ත වැටුප් ව්‍යුහයන්හි විවිධත්වයද සැලකිල්ලට ගනිමින් 1994-07-25 දින අංක 27/94, 1994-08-08 දින අංක 29/94 හා 1994.08.11 දින අංක 30/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලින් බලපෑමට ලක්වූ සේවාවන් වෙන වෙනම ගෙන ඒවායේ වැටුප් ප්‍රතිශෝධනය කිරීමට තීරණය කර ඇත.

03. එම නිසා ඔබගේ පාලනය යටතේ පවත්නා සේවාවලින් අංක 29/94 හා 30/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යටතේ වැටුප් වැඩිකිරීම් නොකරන ලද සේවාවන්හි දැනට පවත්නා වැටුප් ව්‍යුහයන් පරීක්ෂා කර බලා ප්‍රමුඛත්ව පදනමක් මත අධ්‍යයනය කර වාර්තා කරනු පිණිස වැටුප් සහ සේවක සංඛ්‍යා කමිටුවට යොමු කිරීම සඳහා වෙන වෙනම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමට (පූර්ව පිටපතක් අධ්‍යයනය කිරීම සහ දැනගැනීම සඳහා වැටුප් සහ සේවක සංඛ්‍යා කමිටුවට මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට හා ආයතන අධ්‍යක්ෂට යොමු කිරීම) කටයුතු කරන ලෙස සියළුම අමාත්‍යාංශ වලට මෙයින් දැනුම් දෙමි.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය